ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධනදෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ **1.6** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ **2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් **1** හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය **කරනු** නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අත්තිකාරම් බී ගිණුමේ දක්වා ඇති ලැබීම් හා ගෙවීම් එකතුව අතර සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇති රජයේ නිළධාරින්ට ලැබීම් හා ගෙවීම් අතර රු. **166,800** ක වෙනසක් නිරීක්ෂණය විය.	ඉදිරියේදී අඩුපාඩු නොවන අන්දමට කටයුතු කරන බව දන්වමි.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.
(ii)	මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ඒ.සී.ඒ-**5** ආකෘතියේ **2024** දෙසැම්බර් **31** දිනට භාණ්ඩාගාර පොත් අනුව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු. **37,919,916** ක් ලෙස ඇතුලත් කර තිබුණි. එසේවුවද භාණ්ඩාගාර **SA 52** ආකෘති පත්‍රය අනුව එදිනට අනුරූපි ශේෂය රු.**37,882,016** ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව දෙපාර්තුමේන්තු පොත් වල සඳහන් අවසාන ශේෂය හා භාණ්ඩාගාර **SA 52** ආකෘතිය අනුව ශේෂය අතර රු.**37,900** ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම ගැලපීම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වන අතර, අත්තිකාරම් " බී " ගිණුමට අදාලව දක්වා ඇති ශේෂය නිවැරදි බව දන්වමි.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.
(iii)	අත්තිකාරම් "බී" ගිණුමට අනුව හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.706,855 ක් විය. ඉන් සේවය අතහැර ගොස් ඇති නිලධාරී සිව් දෙනෙකුගෙන් වර්ෂ 1-3 කාලය අතර රු. 222,435 ක ණය ශේෂය මෙතෙක් අදාල පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි.	හිඟ හිටි ශේෂ අය කර ගැනීමට කටයුතු කල යුතුය.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ස්ථාවර වත්කම් වටිනාකම රු.මිලියන 4,011.78 ක් වූ අතර, ඉන් රු.මිලියන 3,519.49 ක් එනම් සියයට 88 ක්ම කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද එම කෙරීගෙන යන වැඩ ශේෂය තුල පැවති වැඩ නිම කළ ව්‍යාපෘති වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. තවද, කෙරීගෙන යන වැඩ ශේෂය තුළ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිමකර වෙනත් රජයේ ආයතන හා පාසල්වලට භාරදී ඇති රු. මිලියන 682.62 ක් වටිනා ව්‍යාපෘති 10 ක්ද ඇතුළත්ව තිබුණු අතර, එම ව්‍යාපෘති හඳුනාගෙන එම ආයතන වලට විධිමත් ලෙස පවරා දී ගිණුම්වලට ඇතුළත් කිරීමෙන් පසු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙනත් රාජ්‍ය ආයතනවලට සහ පාසල් වලට භාර දිය යුතු ඉදිකිරීම් වල වටිනාකම ඉදිරියේදී එම ආයතන වලට පවරා දීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි.	වැඩ අවසන් කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් වර්ෂ කිහිපයකට පෙර ඉදි කරන ලද ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනය සහ මාතලේ හොකී ක්‍රීඩාංගනය වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබිය දී මෙම ක්‍රීඩාංගන	මෙම හොකී ක්‍රීඩාංගන මීට වසර ගණනාවකට පෙර ඉදි කර ඇති අතර මෙතෙක් මෙම ක්‍රීඩාංගන දෙපාර්තුමේන්තුවට පවරා ගෙන නොමැත.	මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

වැඩිදියුණු කිරිම සඳහා 2024 වර්ෂයේ දී පිළිවෙළින් රු. මිලියන 154.19 ක් හා රු. මිලියන 165.7 ක් වියදම් දරා තිබුණි.

(ඇ) **අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කල්මුනේ ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාර ව්‍යාපෘතිය වෙනුවෙන් 2020 වර්ෂයේ දී ලබා දී තිබුණු අත්තිකාරම් මුදලින් රු. මිලියන 5.68 ක ශේෂයක් 2024 වර්ෂය අවසාන වන විටත් දෙපාර්තුමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අවසන් ගිණුම සකස් කිරීමේදී මෙම ගැලපීම් සිදු කිරීමට අතපසු වී ඇති බව දන්වන අතර, එය 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.	අත්තිකාරම් මුදල් පියවීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල අදාල ගැලපීම් සිදු කළ යුතුය.

(ඈ) **විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ක්‍රීඩා ශක්ති ජාතික වැඩසටහන යටතේ ක්‍රීඩක පෝෂණ දීමනාව වශයෙන් ජාතික ක්‍රීඩා සංගම් හෝ සම්මේලන 03 ක හා අභියාචනා කමිටු නිර්දේශ ඇතුළු ක්‍රීඩකයින් 193 දෙනෙකුට රු. 3,670,000 ක් ගෙවීම් කර තිබූ නමුත් ක්‍රීඩකයින් එම මුදල් ලබා ගත් බවට අත්සන් හෝ අදාල ගිණුම්වලට බැංකු ගත කිරීමට තහවුරුවක් ඉදිරිපත් කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	අදාළ ක්‍රීඩකයන් වෙත මුදල් ප්‍රේෂණය වූ බවට සහතික විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ii)	2024 වර්ෂයේ පවත්වන ලද ඉන්දු ශ්‍රී ලංකා හබල් ඔරු තරඟාවලිය සඳහා ක්‍රීඩකයින් සහ නිලධාරීන්ට අවශ්‍ය නවාතැන් පහසුකම්, සනීපාරක්ෂන සේවා, ආහාරපාන, තරඟකරුවන්ට සහතික පත්‍ර, පදක්කම් සහ කුසලාන යනාදිය ඇතුලත් සේවාවන් ප්‍රසම්පාදනයන් කර ගැනීම සඳහා රු. 3,924,587 ක මුදලක් වැය කර තිබූ නමුත් අදාල බිල්පත් හෝ ඉන්වොයිසිපත් විගණනයට ඉදිරිපත් නොවීය. තවද, තරඟාවලිය සඳහා ලබා දෙන ආහාර වර්ග නාවික හමුදාව මගින් ලබා ගැනීම සඳහා වියදම රු. 1,598,887 ක් වූ අතර පහසුකම් ලබා ගත් ක්‍රීඩකයින්ගේ, නිලධාරීගේ හා පුහුණුකරුවන්ගේ විස්තර ඇතුලත් නාමලේඛනයක් හෝ සහභාගීත්වය තහවුරු කිරීමට අදාල කිසිදු ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවීය.	අදහස් දක්වා නොමැත.	තහවුරු කිරීමට අදාල ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

2 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.3 (ආ)	කෙරීගෙන යන වැඩ ශේෂය තුළ පවතින දැනටමත් වැඩ අවසන් කර ඇති වත්කම් විධිමත් පරිදි ගිණුම් ගත කිරීමෙන් පසු අදාළ පාර්ශ්වය වෙත පවරා දී මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුයි යන නිර්දේශය.	1.6.1.1 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයන් 03 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු.3,500,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයකට (පිරිසිදු කිරීම සහ සනීපාරක්ෂක) අධි ප්‍රතිපාදන සලසාගෙන තිබීමෙන් එම ප්‍රතිපාදනයෙන් සියයට 80 ක ප්‍රතිශතයකින් වෙනත් වැය විෂයකට මාරුකර තිබුණි.	මෙම අවශ්‍යතාවයන් හදුනාගෙන තිබුණද විධිමත් ක්‍රමවේදයක් මගින් මෙම ක්‍රියාවලිය සිදුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් දෙපාර්තමේන්තුව තුළ නොමැති බැවින් මෙම ප්‍රතිපාදනය ඉතිරි වී ඇත.	නිසි පුරෝකතනයකින් හා තාර්කික පදනමකින් ඇස්තමේන්තු සකස් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන **288.92** ක මුදලක් ජාතික ක්‍රීඩා සංගම් හෝ සම්මේලන වලට ලබාදී තිබුණු බවට විගණනය වෙත වාර්තා කර තිබුණද ශ්‍රී ලංකා හොකී සම්මේලනය හා ශ්‍රී ලංකා ස්කොෂ් සම්මේලනය ඇතුළු සම්මේලනවලට ලබා දී තිබෙන මුදල් එම සංගම් වල නිවරදි ලෙස සටහන් කර නොතිබීම පිළිබඳව පසුවිපරම් කර තහවුරු කරගැනීමට අපොහොසත් වී තිබුණි.	ජාතික ක්‍රීඩා සංගම් හෝ සම්මේලන වලට ලබා දුන් මුදල් විධිමත් ලෙස එම ක්‍රීඩා සංගම් හෝ සම්මේලන වල ගිණුම් ගත වන්නේද යන්න පසු විපරමක් කිරීමට සටහන් කර ගත් බව කාරුණිකව දන්වමි.	ජාතික ක්‍රීඩා සංගම් හෝ සම්මේලන වලට ලබා දෙන මුදල් ගිණුම්ගත වේද යන්න පසුවිපරම් කළ යුතුය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස්	නිර්දේශය

	දැක්වීම	
විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ටොරින්ටන් හොකී ක්‍රීඩාංගනයේ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ඉතිරි මුදල රු. 4,496,780 සහ මාතලේ හොකී ක්‍රීඩාංගනය වෙත ගෙවිය යුතු රු. 48,365,310 මුදල දෙපාර්තමේන්තු ගිණුම් පොත්වල බැරකම් ලෙස හදුනාගෙන නොතිබුණි.	මෙම කොන්ත්‍රාත්තුවේ අමතර වැඩ පිළිබද ඇස්තමේන්තුවක් දෙසැම්බර් **31** වන විට ලැබී නොතිබුණු බැවින්**,** එම බැරකම් ගිණුම් ගත කිරීමට නොහැකි විය.	ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කිරීමට කටයුතු කල යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**නිරීක්ෂණය වටිනාකම (රු.)**	**අනුකූල නොවීම**	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
(i)	මු.රෙ. 756 (6)		භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඊට පසු වර්ෂයේ ජූනි මස 15 දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වූවද 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර සමීක්ෂණ වාර්තාව 2025 අප්‍රේල් 01 දින එනම් මාස 09 ක් ප්‍රමාද වී ලබා දී තිබුණු අතර 2024 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මෙම වාර්තාවේ දින	2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාරිතාව 2025.04.01 දින රජයේ විගණන අංශයට භාර දී ඇත.	එලබෙන වර්ෂයේ ජූනි මස 15 දිනට පෙර වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

			දක්වා ලබා දී නොතිබුණි.		
(ii)	මූ.රෙ 104		කුලියාපිටිය සුභාරතී විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ දී සිදුවී තිබෙන මූල්‍ය වංචාව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකිරීමට නිර්දේශ කර තිබුණු අතර ඒ සඳහා කමිටුවක් පත් කර තිබුණද 2025 මැයි දක්වා අදාළ කමිටු සාමාජිකයින් ගෙන් වාර්තාවක් ලබා ගෙන එම වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කිරීමට දෙපාර්තුමේන්තුව අපොහොසත් වී තිබුණි.	එම කමිටු වාර්තා නිර්දේශ අනුව ඉදිරි කටයුතු කරමින් පවතී.	කමිටු වාර්තා නිර්දේශ අනුව කටයුතු කල යුතුය.
(ආ)	**ජාතික අයවැය චක්‍රලේඛ** 2024 ජනවාරි 01 **දිනැති අංක** 01/2024 **දරන චක්‍රලේඛයේ** පොදු උපදෙස් අනු අංක 12.3	2,429,000	චක්‍රලේඛ ප්‍රකාරව සුහද හමුවීම්, ප්‍රියසම්භාෂණ ආදිය වෙනුවෙන් රජයේ අරමුදල් භාවිතා නොකළ යුතු වුවද දෙපාර්තුමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් පැවති ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩකයින් සඳහා වූ ප්‍රියසම්භාෂණය වෙනුවෙන් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට ගෙවා තිබුණි.	රු.2,429,000 ක් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට ගෙවා තිබුණේ ජයග්‍රාහී රග්බි ක්‍රීඩකයන්ට තිළිණ ප්‍රදාන කිරීමට සහ ළමුන් දිරිගැන්වීමය.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** 2024 දෙසැම්බර් 16 **දිනැති අංක** 06/2024 **දරන**		CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් ගනු ලබන ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව	අතපසු වීමකින් එය මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට නොහැකි වී ඇත.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය 3.1 ඡේදය		විසින් ශේෂ පිරික්සුම මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි.		
(ඇ)	2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළකරන ලද 2024 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝග				
(i)	I කොටසේ 8 වගන්තිය.		දැනටමත් ලියාපදිංචි වී ඇති සියලු ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ තක්සේරු / ඇගයීම් කිරීම් කොට වර්ගීකරණය කිරීම සඳහා සාමාජිකයන් 05 දෙනෙකුට නොවැඩි කමිටුවක් පත්කල යුතු වුවද එම කමිටුව පත්කර වර්ගීකරණය සිදුකිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	05 දෙනෙකුගෙන් යුක්ත කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව මේ වන විට අවශ්‍ය කටයුතු කරමින් පවතී.	සියලු ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ තක්සේරු / ඇගයීම් කිරීම් කොට වර්ගීකරණය කල යුතුය.
(ii)	III කොටසේ 6 (viii) හා (ix) වගන්තිය		නිපුණතා සහිත මලල කීඩකයන් හඳුනාගැනීම සඳහා සෑම ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනයක්ම ක්‍රීඩකයන්ගේ හැකියාවන් හා නිපුණතාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් සැපයීම හා ක්‍රීඩකයන්ගේ ජීව දත්ත, සහභාගී වු තරඟ අවස්ථා, ක්‍රීඩා තරඟ තරඟාවලින්, නියෝජනය කළ කණ්ඩායම්, ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු සහ තේරීම, ශ්‍රේණිගත කිරීම් හා	විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නව නියෝග අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරමි.	නිපුණතා සහිත මලල කීඩකයන් හඳුනාගැනීමේ පද්ධති පවත්වාගෙන යා යුතුය.

වර්ගකිරීම්වලින් සමන්විත විධිමත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතු වුවත් එලෙස පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු සිදු කර තිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ ක්‍රීඩා අරමුදලේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ, දේශපාලන මුහුණුවරක් ගත් Sri Lanka Sports Fiesta 2024 නමින් වූ වැඩසටහනක් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා Dialog ආයතනය එක්ව සංවිධානය කර ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 40ක මුදලක් ජාතික ක්‍රීඩා අරමුදලින් සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලබා ගෙන එම මුදලින් රු. මිලියන 39.06 ක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.	**Sri Lanka Sports Fiesta** 2024 වැඩසටහන අනපේක්ෂිත වැඩසටහනක් වන අතර**,** සංචාරක හා ඉඩම් සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් සංචාරක ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහනක් වන බැවින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී වැඩසටහනට මෙම වැඩසටහන ඇතුලත් වී නොමැති බව දන්වමි.	දෙපාර්තමේන්තුවේ අරමුණු වලට අදාළ වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කල යුතුය.
i.	ඉහත ආයතන අතර ගිවිසුමකට එලඹ නොතිබුණු අතර Dialog ආයතනය මගින් වැඩසටහන සඳහා ලබා දී තිබුණු දායකත්වය හා වැඩසටහන ක්‍රියාත්මක කළ	මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබූ ආයතනය සහ ඩයලොග් සමාගම සමග ඇති කර ගත් අවබෝධතා ගිවිසුම පිළිබඳ විස්තර මොනවාද යන්න මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබූ ආයතනයෙන්	බාහිර පාර්ශවයන් සමග සම්බන්ධවී කටයුතු කිරීමේ දී නිසි ගිවිසුමකට එලඹිය යුතුය.

	දින 03 තුල පවත්වා ගෙන ගොස් තිබුණු ආහාර පාන අළෙවි සැල් තුලින් උපයා ගන්නා ලද කිසිදු ආදායමක් හෝ අනුග්‍රාහක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.	විමසීම සුදුසු යැයි දන්වන අතර, අප දෙපාර්තමේන්තුව කිසිදු සම්බන්ධතාවයක් ඩයලොග් සමාගම සමඟ නොතිබුණි.	
ii.	මෙම වැඩසටහනට සමගාමීව පැවැත්වීමට සැලසුම් කල ක්‍රීඩා තරඟාවලි සඳහා රු. මිලියන 16.8 ක මුදලක් නිදහස් කර තිබුණද රු. මිලියන 3.5 ක වැය දරා පැවැත්වීමට සැලසුම් කරන ලද හොකී තරඟය නොපවත්වා රු. මිලියන 1.53 ක මුදලක් නිශ්කාර්යව වියදම් කර තිබුණි.	එම තරගාවලිය පවත්වනු ලබන දිනය පුරා වර්ෂාව පැවැති බැවින්, හොකී තරගාවලිය පැවැත්වීමට නොහැකි විය.	රාජ්‍ය මුදල් ඵලදායීව උපයෝජනය කළ යුතුය.
iii.	මෙම වැඩසටහන පැවැත්වීම සඳහා කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ඉසව් කළමනාකරණ ආයතනයක් තෝරා ගෙන තිබුණු අතර එම ආයතනයෙන් ලබාගත් සේවාවලට සමාන සේවාවන් ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම විසින්ද ලබා දී තිබීමෙන් එම ආයතනය සඳහා දරන ලද රු. මිලියන 19.91 ක වියදම් විනිවිදභාවයකින් යුතුව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.	ඔබ විසින් අනාවරණය කර ඇති පරිදි දෙපාර්තමේන්තුව විසින් ඉසව් කළමනාකරණ ආයතනයෙන් ලබාගත් සේවාවට සමාන සේවාවක් ශ්‍රී ලංකා තරුණ සේවා සභාවේ යූත් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් Sri Lanka Sports Fiesta 2024 වැඩසටහන සඳහා ලබාගෙන ඇත්නම් ඒ සම්බන්ධයෙන් මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබූ අමාත්‍යාංශයෙන් සහ ශ්‍රී ලංකා තරුණ සේවා සභාවෙන් විමසීම සුදුසු බව කාරුණිකව දන්වන අතර, ඒ සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් නොමැති බව දන්වමි.	රජයට පාඩුවක් සිදු නොවන අයුරින් කටයුතු කළ යුතු අතර පාඩුව අදාළ පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
iv.	වැඩසටහන පැවැත්වීමට නියමිතව තිබූ දින කිහිපයකට පසු ජනාධිපතිවරණය කැඳවීමට නියමිතව තිබූ බැවින් ක්‍රීඩා උළෙලට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජිත සංගීත සංදර්ශනය නොපවත්වන ලෙස මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ කොමසාරිස් විසින් ලබා දුන් ප්‍රතිචාරය කුමක්ද යන්න අප දෙපාර්තමේන්තුව දැනුවත් කර නොමැති අතර, දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබුවේ අමාත්‍යාංශය විසින් ලබා දුන් උපදෙස් වලට අනුව පැවරූ කාර්යයන් සඳහා අමාත්‍යාංශය ලබා දුන් මුදල් තෙවන පාර්ෂව තැන්පත් ගිණුමේ තැන්පත් කර අදාල	මැතිවරණ කොමිසන් සභාවේ උපදෙස් වලට අනුව ක්‍රියකළ යුතුය.

විසින් දැනුම් දී තිබියදී එම උපදෙස්වලට පටහැනිව ආහාර ප්‍රවර්ධන වැඩසටහන්, සංගීත සංදර්ශන යනාදිය පවත්වා තිබුණු අතර ඒ සඳහා ජාතික තරුණ සේවා සභාව හා තරුණ සේවා පුද්ගලික සමාගම විසින්ද රු. මිලියන 16.32 ක වියදමක් දරා තිබුණි.	වැඩසටහන සඳහා ගෙවීම පමණි.

3.5 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ අවුරුදු 2 ට වැඩි තැන්පතු ප්‍රමාණය රු.67,565,979 වන අතර ඒවා සියල්ල ඉදිකිරීම් හා අළුත්වැඩියා සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති 136 කට අදාලව රඳවුම් මුදල් බව නිරීක්ෂණය වූ අතර ඉන් ව්‍යාපෘති 39 ක ඉදිකිරීම් අවසන් කර ඇති නමුත් මේ වන තෙක් නිදහස් නොකළ තැන්පතු වටිනාකම රු. 11,302,388 ක් විය. නමුත් එම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව හෝ රඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍යතාවයක් තිබේද යන්න සලකා බලා අවශ්‍ය පරිදි කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී එම රඳවුම් මුදල් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි.	නියමිත කාළය තුල රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පොදු තැන්පතු ගිණුමේ පවතින රඳවුම් මුදල් වලින් අවුරුදු **2 -5** කාල පරාසයක් සහිත අත්හිටවූ ව්‍යාපෘතිවලට අදාල රු.**1,025,137**ක රඳවුම් මුදල් ද අවුරුදු **05**කට වඩා වැඩි කාලයක සිට අත්හිටුවා ඇති ව්‍යාපෘති **8** කට අදාලව රු.**3,502,776** ක රඳවුම් මුදල් හා රජයේ ආදායමට බැර කළ යුතු තවත් ව්‍යාපෘති **04**කට අදාළ රු. **362,360** ක රඳවුම් මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර	**2025** වර්ෂයේ දී රජයේ ආදායමට බැර කරන බව දන්වමි.	නියමිත කාළය තුල රඳවුම් මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.

නොතිබුණි.

(ඇ)	ඉදිකිරීම් කාලය ඉක්මවී තිබුණද මෙතෙක් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති **50** කට අදාල රු.**31,792,332** ක රැඳවුම් තැන්පතු පොදු තැන්පත් ශේෂයන් තුල පැවතුණි.	මෙතෙක් මෙම ව්‍යාපෘති වැඩ නිම වී නැති අතර, එම රැඳවුම් මුදල් ව්‍යාපෘතියේ ඉතිරිවැඩ අවසන් වූ පසු නිදහස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.	ව්‍යාපෘතිය නියමිත කාළයට අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහජනයා වෙත ආයතනය පිළිබඳ තොරතුරු ලබා දී ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට අවශ්‍ය නිල වෙබ් අඩවියක් නිර්මාණය කර නොතිබුණි.	ඉදිරියේදී මෙය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.	නිල වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**2024** ජාතික ක්‍රීඩා දින දර්ශනයට අනුව ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල ජාතික හා ජාත්‍යන්තර තරඟ පැවැත්වීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ලබා දීමට අපොහොසත්වී තිබුණි.	මේ පිළිබඳ ප්‍රගතිය විගණනයට ලබා දීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත.	ප්‍රගතිය විගණනය වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා 2024 වර්ෂයේ දී රු.මි. 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුල දී ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.	2024 නව රජය බිහිවීමත් සමග දැනට ආරම්භ කර නැති සියලුම ප්‍රාග්ධන ව්‍යාපෘති නතර කරන ලෙස රජය විසින් ලබා දුන් උපදෙස් අනුව මෙම ප්‍රසම්පාදනය නතර කරන ලදි.	ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම් කටයුතු අප්‍රමාදව නිම කිරීමට පියවර ගත යුතුය.

4.3 **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
බිංගිරිය පළාත් ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය යටතේ ඉදිවෙමින් පවතින මීටර් 200 හා මීටර් 400 ධාවන පථ සඳහා 2024 වර්ෂයේ දී පිළිවෙලින් රු.මි. 40 ක හා රු.මි. 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් 2024 වර්ෂය අවසාන වන තෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මීටර් 200 හා මීටර් 400 ධාවන පථයන් ඉදිකිරීමට පිළිවෙලින් රු.මි.2.69 ක හා රු.මි.7.69 ක වියදම් දරා තිබුණද මෙම ඉදිකිරීම් වල වැඩ 2024 දෙසැම්බර් 31 වන විටත් අවසන් වී නොතිබුණි.	මීටර් 400 හා මීටර් 200 ධාවන පථ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රසම්පාදන තීරණය අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත නොකළ බැවින් එම කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නොහැකි වී ඇත.	ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය හා නියාමනය කළ යුතුය.

4.4 **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ අත්හිට වූ ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් අයකර ගැනීමට ඇති අත්තිකාරම් මුදල වන රු. මිලියන 6.4 ක් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය බුන්වත් වීම නිසා අයකර ගැනීමට නොහැකිව පැවතුණි.	මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කරන බව දන්වමි.	අදාල මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

4.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ දී ක්‍රීඩා උපකරණ කට්ටල 200 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 16.59 ක් වැය කර තිබුණු අතර මෙම මිලදී ගැනීමේ දී කිසිදු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් අනුගමනය කර නොතිබුණි. තවද, එම උපකරණ කට්ටල 200 කුමන පාර්ශවයන්හට ලබාදුන්නේද යන්න තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ක්‍රිඩා උපකරණ කට්ටල 68 ක් අදාල පාර්ශවයන් වෙත බෙදා නොදී නිශ්කාර්යව ගබඩාකර තිබුණු අතර උපකරණ කට්ටල බෙදා දීම් සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් සකසා ඒ සඳහා නිසි අනුමැතියක් ද ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.	එවැනි කට්ටල 200 ක් ප්‍රසම්පාදනය කිරීම අසීරු කාරණාවක් බැවින් එසේම ඒ සඳහා මුල් පිරිවැය ඇස්තමේන්තු කිරීමට අපහසු කාරණයක් බැවින්, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට නොහැකි විය. විධිමත් ක්‍රමවේද සකස් කර, ක්‍රියාත්මක කර ගැනීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බැවින්, විගණනය විසින් පෙන්වා දී ඇති අඩුපාඩු සිදුවී ඇත.	මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්තිත්වය විසින් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. ඉතිරි ක්‍රීඩා උපකරණ කට්ටල විධිමත් පරිදි බෙදා හැරීමට කටයුතු කළ යුතු අතර විධිමත් ක්‍රමවේදයක් සකසා ඒ සඳහා නිසි අනුමැතියක් ලබා ගත යුතුය.
(ආ)	48 වන ජාතික ක්‍රීඩා තරඟාවලිය - 2024 ට සමගාමීව දෙපාර්තමේන්තුවේ සේවා නියුක්තිකයන් සඳහා රු.9,920,160 ක වියදමක් දරා ටී ෂර්ට්ස්, බොටම්ස්, කැප්ස්, ෂර්ට්ස්, කලිසම්, බෑග්ස්, සාරි, කුඩ යනාදිය ප්‍රසම්පාදනය කිරීමේදි සැපයුම්කරු තෝරාගත් පදනම විගණනයට වාර්තා කර නොතිබූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් මෙම කාර්යය හදිසි මිලදී ගැනීම් ලෙස සලකා කටයුතු කර තිබුණි.	වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වෙළඳපළ පරීක්ෂාවක් සිදුකර සුදුසු සැපයුම්කරුවන් මගින් මිල ගණන් ලබා ගැනීමෙන් ප්‍රසම්පාදනය කටයුතු සිදු කර ඇත.	දෙපාර්තුමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ මෙම තරඟාවලියේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපදිමින් සිදු කළ යුතුය.

4.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය

2024 අප්‍රේල් 03 දින සිට අප්‍රේල් 22 දක්වා කිරිගිස්ථානයේ දී පැවැත්වූ Senior Asian Wrestling Tournament, Asian Olympic Games Qualifiers and Training Programme - 2024 සඳහා පුහුණුකරු ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් 06 දෙනෙකු සහභාගී වීමට ආරාධනා පත්‍රයේ සඳහන් පරිදි ඊ වීසා ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා වීසා ගැටළුවක් ඇති වී අදාල ගුවන් යානය මඟ හැරී තිබුණි. එම නිසා පළමු අවස්ථාවේ දී ටිකට් මිල දී ගැනීමට දැරූ රු.මිලියන 1.49 ක් වන ගාස්තුවෙන් ලබා ගත් අදාල ගුවන් ටිකට් පත් භාවිතා කිරීමට සිදු වී ඇත්තේ ආපසු පැමිණීමේ දී පමණි. පසුව ඊ වීසා හරහා අදාල තරඟාවලියට පිටත් වීම සඳහා නැවත රු.මිලියන 1.19 ක මුදලක් වැය කර තිබුණි. මේ නිසා රජයට රු.මිලියන 1.19 ක මුදලක් අහිමි වී ඇති අතර ක්‍රීඩකයින්ට දින 5 ක් පමණ ප්‍රමාද වී අදාල තරඟාවලිය සහ වැඩසටහන් සඳහා සහභාගී වීමට සිදු වී තිබුණි.	අදහස් දක්වා නොමැත.	තරඟාවලියට සහභාගී වීම පිළිබඳව පසුවිපරම් කළ යුතු අතර රාජ්‍ය මුදල් ඵලදායීව භාවිතා කළ යුතුය.

4.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**2016** අංක **01** දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග **III** කොටසේ **7 (xii)** අනුව ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන විසින් එළඹෙන වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය අවසන් වීමට මාස **03** කට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කලයුතු වුවත් දැනට ලියාපදිංචි ක්‍රීඩා සංගම්/ සම්මේලන **74** ක් අතුරින් සංගම්/ සම්මේලන **48** ක් පමණක් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර තිබුණි. ක්‍රීඩා සංගම් / සම්මේලන **52** ක් පමණක් **2024** වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර ඒවායින් අක්‍රීය සංගම්/ සම්මේලන **8** ක් තිබෙන බව නිරීක්ෂණය විය.	ඉතිරි සංගම් හා සම්මේලනවලින් මෙම වාර්තා ගෙන්වා ගැනීම පසුවිපරම් කරමින් කටයුතු කරන බව දන්වා දී ඇත.	ක්‍රීඩා සංගම්/ සම්මේලන ක්‍රියාකාරී සැලැස්ම ලබා ගැනීමට හා 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා නියමිත කාළය තුල ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ක්‍රීඩා සංගම් වල විධායක මණ්ඩලයේ නිලකාලයට පෙර ධූරය අත්හිටුවීමේදී එවකට පැවති වත්කම් නිසි ලෙස ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්ගේ භාරයට ගැනීමෙන් පසු අතුරු පාලන කමිටුව භාරයට	විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ පිළිගන්නා අතර, ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි.	මෙම තත්වය මගහරවා ගැනීමට ජාතික ක්‍රීඩා සංගම් දැනුවත් කිරීමක් හෝ කර නොතිබුණි.

ගැනීමෙන් විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති අතර අත්හිටුවීමෙන් පසුවද මූල්‍ය ප්‍රකාශන නොහැකි තත්වයක් උත්ගතවී ඇත. මෙම තත්වය මගහරවා ගැනීමට ජාතික ක්‍රීඩා සංගම් දැනුවත් කිරීමක් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 395 ක් වූ අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 ක් ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 16 ක් ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 78 ක් ද, ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 22 ක් ද, ඇතුළුව මුළු පුරප්පාඩු 124 ක් පැවතුණි. ඒ අනුව, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී 11 කින් වැඩි වී තිබුණි.	මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 124 ක් වන අතර, මෙය සම්පූර්ණ කර ගැනීමට අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇති නමුත් මේ වන තෙක් එය සම්පූර්ණ වී නොමැත.	අවශ්‍යතා සැලකිල්ලට ගෙන හිග කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය.